# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2026.03.08 පැය 1935 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/413/2026 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව ශ්‍රී ලංකා පොලිසියෙන් සැමරුම් උත්සවයක්.**

ශ්‍රී ලංකා පොලිසිය මගින් ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව සංවිධානය කල විශේෂ සැමරුම් උත්සවයක් 2026.03.07 වන දින පොලිස් ක්ෂේත්‍ර බලකා මූලස්ථානය කේන්ද්‍රකර ගනිමින් ළමා හා කාන්තා කටයුතු අමාත්‍ය සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය සහ කොළඹ නගරාධිපතිනී ව්‍රායි කැලී බල්තසාර් මහත්මියගේ ප්‍රධානත්වයෙන් හා පොලිස්පති නීතිඥ ප්‍රියන්ත වීරසූරිය මහතා, පොලිස් සේවා වනිතා ඒකකයේ සභාපතිනී නීටා සමරතුංග මහත්මිය ඇතුළු පොලිස් නිලධරයන්ගේ සහභාගිත්වයෙන් ඉතා උත්කර්ෂවත් අන්දමින් පැවැත්විණි.

කොළඹ විශ්ව විද්‍යාලය අසල සිට පොලිස් නිලධාරිනියන්ගේ පාගමනකින් උත්සවය ආරම්භ කර පොලිස් ක්ෂේත්‍ර බලකා මූලස්ථාන ක්‍රීඩාපිටියේදී කාන්තා වොලිබෝල් තරගාවලියක් ඇතුළු විවිධ අංග වලින් මෙම සැමරුම් උත්සවය වර්ණවත්වූ අතර කාන්තාවන් සඳහා විශේෂ වෛද්‍ය සායනයක්ද පවත්වන ලදී.

ජාත්‍යන්තර කාන්තා දින සැමරුම අලංකාර නර්තන අංග සහ සංගීතමය වැඩසටහන් වලින් විචිත්‍රවත් වූ අතර පොලිස් සංස්කෘතික කොට්ඨාසය සහ පොලිස් බටහිර තූර්ය වාදක කණ්ඩායම විසින් ඒ සඳහා දායකත්වය ලබා දෙන ලදී. ලීසන්ස් රෝහල, මනුසත් දෙරණ සහ නෙස්ලේ ආයතනය විසින් මෙම උත්සවය සාර්ථක කර ගැනීම සඳහා අනුග්‍රාහක දායකත්වය ලබා දී ඇත.

මෙම අවස්ථාවට අදාල ඡායාරූප කිහිපයක් හා වීඩියෝ පටයක් මේ සමඟ යොමු කරමි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**